2024.08.30

# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම 2024
## සිංහල භාෂාව හා සාහිත්‍යය
### 6 ශ්‍රේණිය

විභාග අංකය/නම ...............................

කාලය පැය 02 යි

**පළමු කොටසෙහි අංක 01 සිට 20 තෙක් ඇති ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

### 1 කොටස

01) පහත සඳහන් හිස්තැනට සුදුසු පදය තෝරන්න.

මඬේ සිටවපු ............................................ වගේ.

1) ලීය 2) ඉන්න 3) කණුව 4) තෝට්ටුව

02) ඉරි ඇඳි කොටසෙහි අර්ථය ප්‍රකාශ වන පිළිතුර තෝරන්න.

<u>සුදුහු ගින්දරේ</u> සිටින මිනිසාට වුවමනා වන්නේ කුමන හෝ ආහාරයක් සොයා ගැනීම ය.

1) බඩගින්නෙන් 2) වෙහෙසීමෙන් 3) දුකෙන් 4) වේදනාවෙන්

❖ **03 සහ 04 ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පදය තෝරන්න.**

03) " ස්වාමිනි අපි ඉඳිකටු කුළා නිසා ................................... ගෙන්වුම්හ "

1) බට දඬු 2) ලී දඬු 3) ඉරටු මිටි 4) දර මිටි

04) " දිග .................................. ඇසෙන්නට වියැ."

1) ශබ්දයක් 2) හඬක් 3) නාදයක් 4) හූවක්

❖ **අංක 05 සිට 07 තෙක් ප්‍රශ්නවල හිස්තැනට සුදුසු නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පිළිතුර තෝරන්න.**

05) බෝධිසත්ත්වයන්ගේ .................................. සමෘද්ධ වන්නේ ය.

1) අධිශ්ඨානය 2) අධිෂ්ඨානය 3) අධිෂ්ටානය 4) අධිස්ඨානය

06) එම සතාගේ ................................. තුළින් ආලෝකයක් නිකුත් විය.

1) දක්ශිනාංෂය 2) දක්ෂිනාංශය 3) දක්ෂිණාංශය 4) දත්ෂිනාංසය

07) ................................ ජනයාගෙන් පිරී පැවතුණි.

1) වෙලඳාම් පොල 2) වෙළඳාම් පොල 3) වෙළඳාම් පොළ 4) වෙලඳාම් පොළ

08) යංඥාක්ෂර සහිත පිළිතුර තෝරන්න.

1) වලාකුළු 2) ඥාතීන් 3) පැළය 4) පඬ්වර

09) "ස්වරූපය" යන පදයේ ඉරි ඇඳි පිල්ලම වන්නේ

1) දීර්ඝ ඇදය 2) පාපිල්ල 3) දීර්ඝ පාපිල්ල 4) කෙටි ඇදපිල්ල

❖ අංක 10 සහ 11 ප්‍රශ්න සඳහා මුලින් දී ඇති වචනවලට සමානාර්ථය දෙන වචනය තෝරන්න.

10) මව 1) ගැහැනිය 2) ජනනි 3) පිය 4) මව්පියන්

11) දොම්නස 1) කෝපය 2) දුක 3) සොම්නස 4) සහනය

❖ අංක 12 සහ 13 ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථ දෙන පදය තෝරන්න.

12) මිතුරා 1) යහළුවා 2) සගයා 3) සතුරා 4) සකි

13) හිංසාව 1) දඬුවම 2) අවිහිංසාව 3) අහිංසක 4) ශක්තිය

14) විශේෂණ පදයක් සහිත වාක්‍ය තෝරන්න.

1) කැලෑව තුළින් කළු වලාකුළු නික්මෙයි.

2) වනය ඉතා සුන්දරය.

3) නංගී ගීතයක් ගායනා කරයි.

4) ගොවියා කුඹුරට යයි.

❖ පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට ගැළපෙන වචනය වරහන් තුළින් තෝරන්න.

15) .................................... ගමට යමු. (අපි / අප )

16) .................................... කුඩු කරා පියාඹති. ( කුරුල්ලෝ / කුරුල්ලන් )

17) පහත ඇති වාක්‍ය අතීත කාලයට හැර වූ විට නිවැරදි පිළිතුර වන්නේ

"ළමයා පාසලට යයි"

1) ළමයා පාසලට ගියේ ය.

2) ළමයා පාසලට ගියහ.

3) ළමයා පාසලට යති.

4) ළමයා පාසලට ගියෝ ය.

❖ අංක 18 සහ 19 ප්‍රශ්නවල දී ඇති වාක්‍ය අතරින් නිවැරදි වාක්‍ය තෝරන්න.

18) 1) මිතුරෙක් මට උපකාර කළේ ය.

2) අම්මා පොළට ගියේ ය.

3) ශිෂ්‍යයා පොත පාඩම් කළා ය.

4) මල් සුළඟට සෙලවෙති.

19) 1) අපි ගීතයක් ගයති.

2) ඔබ ගමට යයි.

3) ඈ පොතක් කියවන්නේ ය.

4) ඔවුහු පාසලට යති.

20) " සිරිත් මල්දම" උපදේශ කාව්‍ය රචනා කරන ලද්දේ

1) ඇම්. ඇල්. සිල්වා ගුරු මුහන්දිරම්තුමා

2) එස්. මහින්ද හිමි

3) කුමාරතුංග මුනිදාස මහතා

4) ආනන්ද රාජකරුණා මහතා

(ලකුණු 2x20 = 40)

## II කොටස

1 හා 2 ප්‍රශ්න ඇතුළත් ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න

01) පන්ති කාමරයේ දී කණ්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස සකස් කළ ජනකවි ආශ්‍රිත පොත් පිංච ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i) පොත් පිංච සඳහා යෙදූ නම කුමක් ද? (ලකුණු 02)

ii) එම නිර්මාණය සකස් කිරීමේ දී ගුරුතුමාගෙන්/ ගුරුතුමියගෙන් ලැබුණු උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 04)

iii) පොත සකස් කිරීමට තොරතුරු සපයාගත් මූලාශ්‍ර දෙකක් ලියන්න. (ලකුණු 02)

iv) නිර්මාණය සකස් කිරීමේ දී ඔබේ කණ්ඩායම මුහුණ දුන් ගැටලු දෙකක් ලියන්න. (ලකුණු 04)

v) පොත සකස් කිරීම නිසා ඔබට ලැබුණු ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 16 )

02) පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 150 ට නො අඩු වන සේ රචනයක් ලියන්න.

1) දේශීය ආහාරවල වැදගත්කම

2) හොඳ සිරිත් පුරුදු වෙමු

3) සිත නිවන ජනකවි

4) සුන්දර උදෑසනක් (ලකුණු 14)

03) සමස්ත ලංකා ගායනා තරගයෙන් ප්‍රථම ස්ථානය දිනූ ඔබේ මිතුරාට / මිතුරියට යැවීමට සුදුසු සුබ පැතුම් පතක් නිර්මාණය කරන්න.

නැතහොත්

ඔබ ගිය විනෝද චාරිකාවක් පිළිබඳ ඔබගේ මිතුරෙකුට / මිතුරියකට ලිපියක් ලියන්න. (ලකුණු 10)

04) එගොඩ ගොඩේ නා කණුවේ බැන්ද ගොනා

මෙගොඩ ගොඩේ සපු කණුවේ බැන්ද ගොනා

දෙගොඩ තලා යන වතුරට පැන්න ගොනා

.................................................. ............

1. ඉහත පද්‍යයේ ඉතිරි පද්‍ය පාදය සම්පූර්ණ කරන්න.

2. කවියේ අදහස ඔබේ වචනයෙන් ලියන්න.

3. මෙහි සඳහන් වන විරුද්ධ පද යුගලය උපුටා දක්වන්න.

4. ඉහත සඳහන් කවිය කුමන ජනකවි වර්ගයකට අයත් දැයි ලියන්න.

5. මෙම කවිය ඇතුළත් පාඩමේ නම ලියන්න. (ලකුණු 10)

05) පහත සඳහන් ප්‍රකාශ කවුරුන් විසින් කා හට කියන ලද්දේ දැයි ලියා වගුව සම්පූර්ණ කරන්න.

| ප්‍රකාශය | කවුරුන් විසින් ද? | කා හට ද ? |
|---|---|---|
| 1. " තොපට පින් සිදු වේවා. තොප එදා මා වන මැදට ගෙන ගිය තරම් ඉක්මනට මට එය සිතීම ද නොහැකි යැ" | | |
| 2. " කිමෙක් ද ? දරුවෙනි පැන් නො බොව් දැ" | | |
| 3. " දැන් උල්පතේ හැටි කොහොමද කියා බලමු" | | |
| 4. " එක කාරණයකට නෙවෙයි දහ කාරණේකට උණත් එකග වෙන්නම්? " | | |
| 5. " මේක එක කටකටත් මදිනේ ?" | | |

(ලකුණු 10)

06) පහත ඇති ජේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

ශ්‍රී ලංකාව උත්තර අක්ෂාංශ 5 ත් 10 ත් අතර පිහිටීම නිසා දිවයිනට උණුසුම් දේශගුණයක් පවතියි. මධ්‍යස්ථ ප්‍රමාණයක සුමුදු සුළං සහ සැලකිය යුතු තෙත් බවකින් යුතු කාලගුණයක් මෙරට වේ. මධ්‍යනය උෂ්ණත්වය මධ්‍යම කඳුකරයේ, නුවරඑළිය 15.8 $^0C$ ක අවම අගයක සිට ත්‍රිකුණාමලයේ 29.0 $^0C$ ක ඉහළ අගයක් දක්වා පරාසයකින් යුක්ත වේ.

ජනවාරි සිසිල් ම මාසය බැවින් විශේෂයෙන් කඳුකරයේ වැසියන්ට කබා සහ සීත ඇඳුම් ඇඳීමට සිදු වේ. මෝසම් වැසිවලට පෙර ලබන මැයි මාසය උෂ්ණ කාල පරිච්ඡේදයකි.

1. දිවයිනට උණුසුම් දේශගුණයක් පවතින්නේ ඇයි ?
2. ශ්‍රී ලංකාවේ කාලගුණයේ ලක්ෂණ දෙකක් ලියන්න.
3. ජේදයේ සඳහන් වන ලෙස උෂ්ණත්වය වැඩිම ප්‍රදේශය කුමක් ද?
4. කඳුකර වැසියාට සීත ඇඳුම් ඇඳීමට සිදුවන්නේ ඇයි ?
5. " අවම " යන පදයට විරුද්ධ පදය ලියන්න. (ලකුණු 10)

07) පහත සඳහන් ගද්‍ය පද්‍ය පාඨවල අර්ථය ලිහිල් බසින් ලියන්න.

i) මේ වනයෙහි විෂ වෘක්ෂයෝත් අමනුෂ්‍යාධිගෘහිත වූ පුෂ්කරණිහුත් වෙති.

ii) නමින් පට බැන්දත්
රනින් රුවනින් දිලුණත්
කුලෙන් රජ වූවත්
එයින් පල කිම සිරිත් හැරියොත්

(ලකුණු 5x2 = 10)